# යුරෝපයේ ශ්‍රී ලාංකික භික්ෂු සංගමය

SRI LANKAN BHIKKHU ASSOCIATION IN EUROPE

Dharmanikethanaya, Via Padova, No 318, 20132, Milan, Italy

Tel. 00390239467944 / Email - europebhikkhu@gmail.com


07.10.2026

බන්ධනාගාර කොමසාරිස් තුමා
බන්ධනාගාර ප්‍රධාන කාර්යාලය,
කොළඹ

<u>කාරුණික අවධානය පිණිසයි</u>

ගරු කොමසාරිස් තුමනි,

යුරෝපයට අයත් ජර්මණිය, ප්‍රංශය, ඉතාලිය, ස්විස්ටර්ලන්තය ඇතුළු රටවල් 12 ක වැඩ වෙසෙන ශ්‍රී ලාංකීය භික්ෂූන් වහන්සේලාගේ ඒකාබද්ධතාවයෙන් සැදුම්ලත් ප්‍රධාන සංවිධානය වන්නේ යුරෝපයේ ශ්‍රී ලාංකීය භික්ෂු සංගමයයි.

යුරෝපයේ වෙසෙන ලක්ෂ සංඛ්‍යාත ශ්‍රී ලාංකිකයන්ගේ ආගමික නායකත්වය ඒ ඒ රටවල දී සපයනු ලබන්නේ අප සංගමයට අයත් ස්වාමීන් වහන්සේලා විසිනි. ශ්‍රී ලාංකීය ජනතාව ලෙස ලොව කොතැනක සේවය කළ ද ශ්‍රී ලාංකීය සංස්කෘතික අනන්‍යතාවයන් ආරක්ෂා කර ගනිමින් අප මාතෘ භූමියට ලෙන්ගතුව ක්‍රියා කිරීම පිණිස ඔවුන්ට මාර්ගෝපදේශකත්වය සපයන්නේ ද උන්වහන්සේලා ය.

කොමසාරිස් තුමනි, රටක ව්‍යවස්ථා දායක ය, විධායක ය හා අධිකරණය යන ත්‍රිත්වයේ සාධනීය ගරුත්වය හා ක්‍රියාකාරීත්වය මත එරට වර්තමානය මෙන්ම අනාගතය ද සාර්ථක හා සෞභාග්‍යමත් වන බව සත්‍යයකි. එබැවින් ශ්‍රී ලංකාවේ අධිකරණය හා එහි දී ගනු ලබන තීරණ හා තීන්දු පිළිබඳව අවනත වීම සියළු ගිහි පැවිදි රට වැසියන්ගේ යුතුකම බව අප සංගමයේ ද පිළිගැනීමයි.

මේ වන විට නෛතික වශයෙන් වැරදිකරුවන් බවට පත් වූ භික්ෂූන් වහන්සේලා කිහිප නමක් ම බන්ධනාගාර ගතවී දඬුවම් විඳිති. බන්ධනාගාරගත සිරකරුවන් සඳහා ඇති නීතිරීති ප්‍රකාරව උන්වහන්සේලාට ද කටයුතු කිරීමට සිදුවීම සාමාන්‍ය දෙයකි. ඒ පිළිබඳව යහපත හෝ අයහපත පිළිබඳ අදහස් දැක්වීම අපට අදාළ නොවේ. එහෙත් එක් කරුණක් කෙරෙහි පමණක් ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරනු කැමැත්තෙමු.

භික්ෂුවකගේ අනන්‍යතාවය හෙවත් භික්ෂුවක් ලෙස සමාජය හඳුනා ගනු ලබන ප්‍රධාන සාධකය වන්නේ උන්වහන්සේගේ ශාසනික නිල ඇඳුම වන බුද්ධ චීවරයයි. බන්ධනාගාරය තුළ භික්ෂූන් වහන්සේලාට චූදිතයන් ලෙස පොදු ඇඳුමකින් සැරසී සිටීමට සිදු වුවද, බන්ධනාගාරයෙන් පිටතට රැගෙන යන අවස්ථා වල දී උන්වහන්සේලා ගිහි ඇඳුමකින් රැගෙන යාම, කාගේත් අවධානය යොමු වන කරුණක් වනු ඇත. ප්‍රධාන ජනමාධ්‍ය තුළ පමණක් නොව සමාජ මාධ්‍ය ඔස්සේ ද එය ප්‍රධාන ප්‍රවෘත්තියක් බවට පත් වීමට ගත වන්නේ ඉතා කෙටි කාලයකි. එය බෞද්ධ මෙන්ම අබෞද්ධ ජනතාවගේ ද මහත් කම්පනයට හේතු වන කරුණකි.

දඬුවම් කාලය අවසන් වූ පසු නැවත උන්වහන්සේලා ශාසනික කටයුතුවල නිරත වෙමින් සිය අධ්‍යාත්මික ගමන යා යුතුය. පොදු සමාජයේ යහපත උදෙසා සිය ශාසනික මෙහෙවර ඉටුකළ

යුතුය. එබැවින් පුද්ගල පෞර්ෂත්වයට හානියක් නොවන පරිදි ‘දඬුවම’ ‘පුනරුත්තාපන’ ලක්ෂණයන්ගෙන් ද සමන්විත විය යුතු බව අපගේ වැටහීමයි.

එබැවින් බන්ධනාගාරයෙන් පිටතට උන්වහන්සේලා කැඳවාගෙන යන අවස්ථා වලදී, නෛතිකව ඇති කවර හෝ ඉඩක් උපයෝගී කර ගනිමින් සිය ශාසනික නිල ඇඳුම වන සිවුර පොරවාගෙන යාමට උන්වහන්සේලාට අවකාශ සලසා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමු.

එය පොදු මහ ජනතාවගේ සොම්නසට හේතුවන අතරම බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කීර්ති නාමයට ද වටිනාකමක් එක්කරනු ඇත යනු අපගේ විශ්වාසයයි.

මෙය අප සංගමයේ පමණක් නොව යුරෝපයේ අප විහාරස්ථාන හා සම්බන්ධව සිටින දහස් සංඛ්‍යාත ජනතාවගේ ද කාරුණික ඉල්ලීමක් බව සඳහන් කරනු කැමැත්තෙමු.

තෙරුවන් සරණයි.

..........................

මොරවක සෝරත නායක ස්ථවිර
මහා ලේඛකාධිකාරී
සයිප්‍රසයේ ප්‍රධාන සංඝනායක

..........................

රත්මලේ පුඤ්ඤරතන නායක ස්ථවිර
ගරු සභාපති
ජර්මණියේ ප්‍රධාන අධිකරණ සංඝනායක

පිටපත් යොමුව : අතිගරු මහානායක මාහිමිපාණන් වහන්සේලා
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපති තුමා
විෂය භාර අමාත්‍ය තුමා